# ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

**අංක 12,830 — 1961 දෙසැම්බර් 21 වැනි බ්‍රහස්පතින්ද — 21.12.1961**

ආණ්ඩුවේ බලයපිට ප්‍රසිධ කරන ලදි


# I වැනි කොටස: (I) වැනි ඡේදය - සාමාන්‍ය

## ආණ්ඩුවේ නිවේදන

අ. ආ. කා. අංකය : ඩබ්ලිව්. 64/61 (9)

### මහජන ආරක්‍ෂක පනත

(40 වෙනි අධිකාරය)

අග්‍රාමාත්‍යවරයාගේ නිර්දේශය අනුව, මහජන ආරක්ෂක ආඥාපනතෙහි 5 වෙනි වගන්තිය යටතේ, අග්‍රාණ්ඩුකාරවරයා විසින් පනවනු ලබන නියෝගය.

ඕ. ඊ. ගුණතිලක,
අග්‍රාණ්ඩුකාරවරයා.

අග්‍රාණ්ඩුකාරවරයාගේ කාර්‍යාලය,
1961, දෙසැම්බර් 21,
කොළඹ.

### නියෝගය

1961 අංක 9 දරන හදිසි (විවිධ විධිවිධාන හා බලතල) නියෝගවල 30 වෙනි නියෝගයට ඉක්බිති ව ම, පහත දැක්වෙන අලුත් නියෝගය යෙදීමෙන් ඒ නියෝග මෙයින් සංශෝධනය කරනු ලැබේ.

"පැට්‍රෝල් විකිණීම හෝ සැපයීම විධිමත් කිරීම හා පාලනය කිරීම.

30 අ. (1) අග්‍රාමාත්‍යවරයා විසින් ආඥාවකින් නියමිත ලංකාවේ යම් ප්‍රදේශයක් සම්බන්ධයෙන් නිසි බලධරයකු විසින් නියමයන් හි නියමිත යම් ප්‍රදේශයක පැට්‍රෝල් සිල්ලර ගබඩාවක් භාරයේ ඇති තැනැත්තකු විසින් පැට්‍රෝල් බෙදා හැරීම හෝ විකිණීම විධිමත් කිරීම හා පාලනය සුරක්ෂිත කිරීමේ කාර්‍යය සඳහා අවශ්‍ය විය හැකි සියලු නියමයන් කලින් කල නිකුත් කළ හැකි ය. තවද ඒ නියමයන් ඉෂ්ට කිරීම ඒ තැනැත්තාගේ යුතුකම විය යුතු ය.

(2) යම් පැට්‍රෝල් සිල්ලර ගබඩාවක් භාරයේ ඇති තැනැත්තකු විසින් පැට්‍රෝල් විකිණීම හෝ සැපයීම සම්බන්ධයෙන් මේ නියෝග යෙහි 1 වෙනි ඡේදය යටතේ නිසි බලධරයකු විසින් නිකුත් කරනු ලැබූ නියමවල, ඒ බලධරයා විසින් කලින් අනුමත කරනු ලැබූ තැනැත්තන්ට හැර, ඒ ගබඩාවේ දී යම් තැනැත්තකුට පැට්‍රෝල් විකිණීම හෝ සැපයීම වළක්වන්නා වූ හෝ, යම් විශේෂ තැනැත්තකුට හෝ යම් විශේෂ පන්තියක හෝ විස්තරයක තැනැත්තන්ට හෝ පැට්‍රෝල් සැපයීම වළක්වන්නා වූ ද ඒ ගබඩාවෙහි පැට්‍රෝල් විකිණීම හෝ සැපයීම විධිමත් කිරීමේ හා පාලනය කිරීමේ කාර්‍යය සඳහා අවශ්‍ය විය හැකි අන් කිසි සියලු කරුණු සම්බන්ධයෙන් ද විධිවිධාන ඇතුළත් විය හැකි ය.

(3) මේ නියෝගයෙහි "පැට්‍රෝල්" යන පාඨයෙන් පැට්‍රෝල් (සැපයීම් පාලනය කිරීමේ) ආඥාපනතෙහි (174 වෙනි අධිකාරය) විස්තර කරනු ලැබූ පැට්‍රෝල් අදහස් වේ. තවද "පැට්‍රෝල් සිල්ලර ගබඩාව" යන්නෙන් පැට්‍රෝල් සිල්ලර වශයෙන් විකුණනු ලබන යම් ගබඩාවක්, ස්ථානයක් හෝ අන් කිසි භූමියක් අදහස් වේ".


ලංකාවේ වැලව්වේනයෙහි පිහිටි "ඊස්ටන් පේපර් මිල්ස් කෝපරේෂන්" හි නිපදවන ලද කඩදාසිවල ලංකාණ්ඩුවේ මුද්‍රණාලයයේ මුද්‍රාපිතයි.

2345—ජේ.ඇන්.ආර් 566—7,100 (12/61)